# ගැමි ලියට අතුරු ආදායමක්...

# ගෘහාශ්‍රිත ගව පාලනය


**ආර්.එල්.එන්. ජයතිස්ස**

*පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී*

කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය


**ලෝකයේ කුඩා හෝ වේවා විශාල හෝ වේවා යම්කිසි රටක් බලවත් ආර්ථිකයක් සහිත ස්වාධීන රටක් බවට පත් වීමට මූලික සාධකය වන්නේ ආහාර අතින් ස්වයංපෝෂිත භාවය ඇතිකර ගැනීමයි. වර්තමාන ආසියාවේ බලවත් ආර්ථිකයන් පවතින රටවල් වන ඉන්දියාව සහ චීනය යන රටවල් දෙස විමසිල්ලෙන් බැලීමේ දී මෙම තත්ත්වය වටහා ගැනීමට හැකි වන්නේය.** වර්තමාන ලෝක කාර්මික හා වෙනත් සියළුම අංශ වලින් බලවත්ම ආර්ථිකයක් නිර්මාණය කරගෙන ඇති ඇමරිකාව පවා එම තත්ත්වය උදාකරගෙන ඇත්තේ කෘෂි කාර්මික ආර්ථිකයක් මුල් කරගත් **සංවර්ධන** ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමෙනි. **මහාචාර්ය ඒ.එස් බී. රාජගුරු 2004 ජූලි 27** අනුව, ශ්‍රී ලංකාව විසින් ද, සිය සංවර්ධන ප්‍රයත්නයේ දී අනුගමනය කළ යුතු මාර්ගය වශයෙන් දැක්වීමට හැක්කේ ද, පළමුව කෘෂි කර්මයෙන් රටේ ස්වයංපෝෂිත භාවය ඇති කර ගැනීම යි. කෘෂිකර්මයේ දී ප්‍රධාන වශයෙන් ආහාර බෝග නිෂ්පාදනය සහ සත්ත්ව පාලනය යන ප්‍රධාන අංග දෙක පිළිබඳව අවධානය යොමු කළ යුතු වන්නේ ය. මෙම ලිපියේ දී විමර්ශනය කිරීමට බලාපොරොත්තු වන්නේ කෘෂිකර්මයේ උප ප්‍රධාන අංශයක් වන සත්ත්ව පාලනයේ ගව පාලනය පිළිබඳව ය.

**සත්ත්ව පාලනය යන්න ලෝකයේ පැරණිතම ජීවන වෘත්තීය ලෙස හැඳින්වීම නිවැරදි ය.** ලෝක ඉතිහාසය පිළිබඳව විමර්ශනය කරන විට හමුවන ප්‍රධානම ජීවනෝපාය වන්නේ සත්ත්ව පාලනයේ යෙදුන එඬේරුන් ය. එඬේරුන් වශයෙන් තම ගව පට්ටි පෝෂණය කරමින් තැන තැන ජීවත් වූ මිනිස් සමාජ පිළිබඳව මෙහි දී සදහන් වේ. එඬෙරුන් වශයෙන් සුළු ආසියාවේ විශාල තෘණ තලාවන් හි ජීවත් වූ පිරිස් වරින් වර දුර්ග මාර්ග ඔස්සේ ඉන්දියාවට පැමිණ ඉන්දියාවේ පදිංචි වී බෝග වගාව සහ සත්ත්ව පාලනය ඇතුලත් කෘෂිකාර්මික ජීවනෝපායයන් ආරම්භ කළහ. ක්‍රි. පූ. 6 වන සියවසේ ඉන්දියාවේ කුල නිර්මාණය ගැන කියැවෙන වේද ගීතිකාවකට අනුව, එකල සමාජය **බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර** යන ප්‍රධාන කුල 3 කට බෙදා පැවති බවත්, එයින් වෛශ්‍ය නමැති කුලය වෙළදාම, කෘෂිකර්මාන්තය සහ ගව පාලනය ප්‍රධාන ජීවනෝපාය කොට ගත් බවත් දක්වා තිබේ. ඉන්ද්‍රිය සමාජයට අනුව, ක්ෂත්‍රියයන් නොහොත් රාජ්‍ය පාලකයින් හැරුනු විට, උසස් කුලයක් වූයේ කෘෂි කර්මාන්තය සහ ගව පාලනයේ යෙදුනු ජනතාව යි.

ශ්‍රී ලංකාවේ ද අතීතයේ දී, ජන ජීවිතය සමන්විත වී තිබුනේ කෘෂිකර්මය, සත්ත්ව සම්පත සහ පරිසරය සමග සම්ප සබඳතාවය කින් යුක්තව ය. ගැමි ගෙදර ප්‍රධානම වස්තු හැටියට පැවතියේ කෘෂිකාර්මික ඉඩම්, කෘෂිකාර්මික කටයුතු හා කිරි ලබා ගැනීම සඳහා ඇති කළ ගව පට්ටි මෙන්ම කෘෂිකාර්මික ආම්පන්නයන් ය. **ගැමුණු කුමරු කොත්මලේ,** ගම ගෙදරක වාසය කලේ එම ගෙදර ගව රංචුව බලා ගනිමිනි. ග්‍රාමීය එක් ගෘහස්ථයක පොහොසත්කම මනින ලද ප්‍රධාන මිනුම් දණ්ඩක් වූයේ, එම වැසියන් සතු වූ ගව සම්පත යි. එම නිසා, ගවයින් සහ කිරි එකල සමාජයේ විශේෂ වටිනාකමකින් යුත් ගෞරවාන්විත ජීවන ක්‍රමයක අංගෝපාංග ලෙස සැලකිනි. එකල පැවති ගම්බද නිවාස, ආහාර ආරක්ෂණය සඳහා වූ **වී බිස්ස** කින් මෙන්ම නිවසේ සම්පත වූ ගවයන් ගාල් කරන ලද ගව ගාලකින් ද සමන්විත විය. වියළි කලාපීය පුරාණ ගමෙහි ද එක්තරා කොටසක් ගමෙහි වූ ගවයන්ට තණ උලාකෑම සඳහා වෙන් කරන ලද තණ පිටි වලින් සමන්විත විය.

මෙලෙස පැවති ගම, 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්ති මෙරටට හඳුන්වා දෙන තුරු ඉතා සුළු වෙනස්කම් වලට පමණක් භාජනය වෙමින් ක්‍රමයෙන් විකාශනය වෙමින් පැවතිනි. **විවෘත ආර්ථිකය යටතේ ශ්‍රී ලංකා ආර්ථිකයේ මෙතෙක් පැවති සියළුම ගති ලක්ෂණ වෙනසකට භාජනය වෙමින් නවතම ගති ලක්ෂණ වලින් යුත් ගමක් නිර්මාණය විය.**

නිදහස් ආර්ථික ප්‍රතිපත්ති යටතේ නිදහසේ පාරිභෝජනය මෙන්ම ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය කිරීමත්, නිදහස් වෙළද කලාප සහ ආයෝජන කලාප බිහිවීමත් සමඟ ගම්බද තරුණ තරුණියන්ට ඒවායේ රැකියා ඉඩ ප්‍රස්ථා බිහිවීමත්, මැද පෙරදිග රටවල ගෘහ සේවය සඳහා මෙරට ග්‍රාමීය කාන්තාවන් වැඩි වැඩියෙන් විදේශගත වීමත් රූපවාහිනී,ගුවන් විදුලි වැනි ජන සන්නිවේදන ක්ෂේත්‍ර ග්‍රාමීය මට්ටම දක්වා දියුණු වීමත්, පසු කාලීනව ඇරඹුනු උතුරු - නැගෙනහිර

යුධමය තත්ත්වය හේතුවෙන් ගම්බද තරුණ - තරුණියන් ආරක්ෂක අංශවල සේවය සඳහා වැඩි වැඩියෙන් සම්බන්ධ වීමට අවස්ථාව හිමිවීමත් නිසා සම්ප්‍රදායික ගම තුළ වෙනස්කම් රාශියක් නිර්මාණය විය.

පළමුව, ගමෙහි වූ ආවෘතභාවය බිඳී ගොස් ලෝකයත් සමග සම්බන්ධ වීම නිසා ජනතාවගේ සිතුම් පැතුම් ආකල්ප ගති ලක්ෂණයන් හි වෙනසක් සිදුවිය. ගමෙහි දෙකන්නයක් වගා කළ තිල්වන් කුඹුරු යාය, වගා කිරීමට ශ්‍රමය හිඟ වීමෙන් කුඹුරු අත්හැර දැමීමත්, කුඹුරු ඉඩම් වෙනත් වාණිජමය කටයුතු සඳහා ගොඩ කිරීමත් ඇරඹිණි. **ගොවිපල බලය සඳහා යොදාගත් ගවයා වෙනුවට ට්‍රැක්ටර් සහ කොළ මඩින යන්ත්‍ර ආදේශ වීමෙන්, සමාජය වෙත ගවයාගෙන් පැවති වටිනා මෙහෙවර අවතක්සේරුවට භාජනය වී ගවයා යනු මස් සඳහා ඇති කරන සතෙකු බවට පත්විය.** පිටරටින් ආනයනය කළ විවිධ වර්ග වලට අයත් පිටිකිරි පිළිබඳව දැවැන්ත වෙළඳ ප්‍රචාර වලට හසු වූ මෙරට ජනතාව එළකිරි බීම වෙනුවට ආනයනික පිටිකිරි බීමට තව තවත් ඇබ්බැහි විය. මෙතෙක් නිෂ්පාදන ඒකකයක්ව පැවති ස්වයංපෝෂිත වූ ගම, එයට ආවේණික වූ සම්පත් එලෙසම පැවතීමට ඉඩහැර, ගමෙහි ශ්‍රමය නගරයේ සේවාවන් හෝ මැද පෙරදිග සේවාවන් හෝ සඳහා නගර කරා ඇදී යන්නට විය. ගමෙහි වූ නිෂ්පාදනය ඇණහිට ගම අක්‍රියාකාරී ඒකකයක් බවට පත් විය. මෙවැනි තත්ත්වයක් ඇරඹීමට හේතු වූයේ මෙතෙක් පැවති සරල ජීවන තත්ත්වය යටතේ පැවති **අත්තම** වැනි වටිනා ගම්බද සංකල්ප ගිලිහී ගොස් ගොවිපළ බලශක්තිය සඳහා යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම නිසා නිෂ්පාදන පිරිවැය ගොවියාට දරාගැනීමට නොහැකි මට්ටමකට වර්ධනය වීම නිසාවෙනි. මේ නිසා, ගම්බද බොහෝ ගොවි ඇත්තෝ කෘෂිකර්මය පාඩු ගෙන දෙන රැකියාවක් ලෙස සළකා ඉන් බැහැර වීමට කල්පනා කළෝය.

> ***ගොවිපල බලය සඳහා යොදාගත් ගවයා වෙනුවට ට්‍රැක්ටර් සහ කොළ මඩින යන්ත්‍ර ආදේශ වීමෙන්, සමාජය වෙත ගවයාගෙන් පැවති වටිනා මෙහෙවර අවතක්සේරුවට භාජනය වී ගවයා යනු මස් සඳහා ඇති කරන සතෙකු බවට පත්විය.***

වර්තමානය වන විට, ශ්‍රී ලංකාවේ පවතින සමාජ - ආර්ථික පසුබිම, මෙවැනි ස්ථානයක පැවතිය ද, ශ්‍රී ලංකාව තවමත් ග්‍රාමීය මට්ටමක පවතී. රටේ මුළු ජනගහනයෙන් 70% ක් පමණ ගම්බදව ජීවත් වන්නේය. වගා නොකරන බිම් කඩවල් වලින් බහුල වූ ගම්බද කුඹුරු, කැළෑ වැවුන ගොවි ගෘහස්ථවල ඉඩම් ප්‍රයෝජනයකට නොගෙන පවතී. එලෙසම ගම්බදව පුළුල්ව පැතිර ගිය දුප්පත්කම ද නැතුවා නොවේ. මේ සියල්ලෙහිම ප්‍රතිඵලය වශයෙන්, ශ්‍රී ලංකාවේ ආනයන අපනයන අතර පරතරය අවාසි සහගත ලෙස පුළුල් වී එහි වෙළඳ ශේෂය පිරිහී තිබේ. ග්‍රාමීය ළදරුවන්ගෙන් 25% ක් මන්ද පෝෂණයෙන් පෙළේ. එමනිසා, 1977 සිට ගත වූ 27 වසරක ආර්ථිකයේ ගමන් මග සහ ශ්‍රී ලංකාවේ සමස්ථ සමාජයට සිදු වූ වාසි - අවාසි පිළිබඳව සමාලෝචනයක යෙදී, වැරදි ආර්ථික කළමනාකරණය නිසා සිදු වූ හානි අවම කර ගැනීම සඳහා යම් යම් ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතු වන්නේය. මෙම අදහස ක්‍රියාත්මක කිරීමේ දී කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආහාර බෝග වගාව සහ සත්ත්ව පාලනය යන අංශයන් හි වර්තමානයේ දී සිදු වී ඇති අඩපනවීම් නිවැරදි කිරීමට ද ක්‍රියාකළ යුත්තේය. මෙහි දී කෘෂිකර්මයෙ හි ප්‍රධානම පාර්ශව යක් වන සත්ත්ව පාලනයෙහි ගව පාලනය පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් ය.

ඉහතින් විස්තර කරන ලද පසුබිම මත, තවදුරටත් විශාල සම්පත් ප්‍රමාණයක් ප්‍රයෝජනය කට නොගෙන අතහැර දමා තිබේ. එකම කාර්ය ගෘහ පාලනය පමණක් කරගත් අතිවිශාල ස්ත්‍රී ජනගහනයක් ද ශ්‍රී ලංකාවේ වෙසෙයි. **පොලොන්නරුව** දිස්ත්‍රික්ක යේ **මැදිරිගිරිය** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහ **හම්බන්තොට** දිස්ත්‍රික්කයේ **වීරකැටිය** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කරන ලද සමීක්ෂණයකට අනුව, ඒවායේ ජනගහනයෙන් 45% ප්‍රමාණයක් ස්ත්‍රී ජනගහනය විය. මෙම ස්ත්‍රී ජනගහනයෙන් බහුතරය කරන ලද එකම කාර්යය වූයේ ගෘහ පාලනය පමණි. **වර්තමාන ශ්‍රී ලංකාවේ බොහෝ ගම්බදව ඉවුම් පිහුම් පමණක් එකම කාර්යය කරගත් ජාතික නිෂ්පාදනයට යම්කිසි දායකත්වයක් දිය හැකි එහෙත් එසේ නොකරන අතිවිශාල ජනතාවක් වෙසේ.** මෙම පිරිසට ඉතා යෝග්‍ය රැකියාවක් ලෙස ගව පාලනය හඳුන්වා දීමට පුළුවන. කුඩා ගෙවතුවල **දිගේලි** ක්‍රමයට ගව පාලනය කිරීමට පුළුවන. තව ද, අස්වනු නෙලාගත් පසු ගමේ වෙල් යාය යළිත් වගා කන්න අරඹන තුරු ගවයන්ට ආහාර සැපයීමට භාවිතා කිරීමට පුළුවන.

ග්‍රාමීය මට්ටමේ ප්‍රති-සංවිධාන මාර්ගයෙන් කාන්තාව-න්ට වර්තමාන ආර්ථික තත්ත්වය පිළිබඳව දැනුමක් ලබාදීම සහ ගව පාලනයේ වැදගත්කම පිළිබඳ ඔවුන් දැනුවත් කළ යුතු වේ. වර්තමානයේ ඉඩම් කුඩා කොටස් වලට බෙදී ගොස් ඇති නිසා කුඩා ගෙවත්තක ගවයෙකු, දෙදෙනෙකු පෝෂණය කරගත හැකි ආකාරය පිළිබඳව ද මෙම ජනතාව දැනුවත්

> ***ශ්‍රී ලංකාවේ ගම්බදව ඉවුම් පිහුම් පමණක් එකම කාර්යය කරගත් ජාතික නිෂ්පාදනයට දායකත්වයක් නොමැති ජනතාවක් වෙසේ.***

කල යුතු වේ. **හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය** විසින් ක්‍රියාවට නගන ලද **ෆාම් වැඩ සටහන සහ තිරසර සංවර්ධන ගම්මාන** වැඩ සටහන ආශ්‍රයෙන් ලබාගත් අත්දැකීම වූයේ ගම් මට්ටමේ කාන්තා ජනගහනය ගව පාලනයට යොමු වීමට කැමැත්තෙ-න් සිටින බවයි. එසේම මෙම ව්‍යාපෘතියෙන් දැනගත හැකි වූයේ ගව පාලනයට ජනතාව යොමු කරවීමේ වැඩසටහන් වර්තමාන-යේ දී නොමැති බවයි. පශු වෛද්‍ය මධ්‍යස්ථාන, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පැවතිය ද, ඔවුන්ට වාහන වැනි පහසුකම් සලසා දී තිබුන ද, ගම් මට්ටමේ ජනයා ගව පාලනය කෙරේ වැඩි වැඩියෙන් හුරු කිරීමේ වැඩසටහන් ඉතා අල්ප ය. **ෆාම් වැඩසටහන සහ තිරසර සංවර්ධන ගම්මාන වැඩ සටහන** වැනි ගම් සංවර්ධන වැඩ සටහන් යටතේ ගව පාලනය කාන්තාවන් අතර ජනප්‍රිය කරවීමේ වැඩ සටහනක් සහ ගව සායන වැනි වැඩ සටහන් අරම්භ කොට පවත්වා ගෙන යනු ලැබීය. එවැනි වැඩ සටහන් හැම ගමකට ම නොමැති නිසාත්, පශු වෛද්‍ය හා සත්ත්ව සංවර්ධන අංශයෙන් එවැනි වැඩසටහන් පැවැත්වීම අඩු වීමත් නිසා ගව පාලනය හා ගම්බද ගෘහණිය අතර සම්බන්ධ-තාවය තව දුරටත් දුරස්ථ වී තිබේ. මෙම දුරස්ථ භාවය නැතිකර කාන්තාවගේ සමාජ ආකල්ප හා ගති පැවතුම් වෙනස්කම් වලට භාජනය කර ඔවුන් ගව පාලනය කෙරේ හුරු කිරීම ජාතික අවශ්‍යතාවයක් බවට පත් වී හමාරය.

***කාන්තාව විසින් ද, පවුලට ආදායමක් එක් කිරීම සහ පවුලේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා වූ ක්‍රියාකාරකමක් වශයෙන් ගව පාලනයට යොමු වීම අතිශය කාලෝචිත ක්‍රියාවකි.***

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයෙහි ඉතා වැදගත් උප ක්ෂේත්‍රය වන්නේ සත්ත්ව පාලන අංශය බව ඉහත දී සඳහන් විය. මෙරට ආර්ථික සංවර්ධනයේ දී 75% ක් වන ග්‍රාමීය ප්‍රජාවගේ ආදායම, රැකියාමය අවස්ථා ජනිත කිරීම සහ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීම යන අංශයන් පුළුල් කිරීමේ ප්‍රධානතම උපාය මාර්ගයක් වශයෙන් සත්ත්ව පාලනය ප්‍රයෝජනයට ගැනීමට පුළුවන. ශ්‍රී ලංකාව ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීමේ කාර්යයේ දී, සත්ත්ව පාලන අංශයේ, ගව පාලන ක්ෂේත්‍රයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

**සත්ත්ව පාලන අංශයේ වර්තමාන තත්ත්වය**

වර්තමානයේ සත්ත්ව පාලන අංශය, ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට 6% ක එකතුවක් කරන්නේය. සෘජුව සහ වක්‍රව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 32% ප්‍රමාණයක් මෙම අංශයේ නියැලී සිටින බව වාර්තා වේ. සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2002 වසරේ වාර්තා වලට අනුව, එළ හරක් ගහනය 1240000 ක් හා මී හරක් ගහනය 643,000 කි.

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය** විසින් 2004 වර්ෂයේ **මැදිරිගිරිය** සහ **වීරකැටිය** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 හි, කෘෂිකාර්මික නොවන ජීවන මාර්ග පිළිබඳව කරන ලද සමීක්ෂණයේ දී ගැමි ගෘහස්ථ වල මුළු ජනගහනයෙන් **මැදිරිගිරියේ 42% ක් ද, වීරකැටි-යේ 45% ක් ද,** කාන්තාවන් විය. මෙම ගෘහස්ථ වල ආදායම් මාර්ග අතරින් සත්ත්ව පාලනයෙන් එකතු වන ආදායම 1% ක් පමණ විය. මෙම තත්ත්වය සළකන විට කිසිසේත්ම සතුටුදායක තත්ත්වය ක් නොවේ. මෙම 42% හා 45% ක් පමණ වූ කාන්තා ජනගහන-යෙන් ගෘහස්ථ කාන්තාවන්ගේ කාර්ය වී ඇත්තේ ඉවුම් - පිහුම් කටයුතුවල නියුතු වීම පමණි. **වර්තමාන සොයා ගැනීම් වලට අනුව, ගවයකු ඇති කිරීම සඳහා හෙක්ටයාර් එකකට අඩු බිම් ප්‍රමාණයක් ප්‍රමාණවත් වේ.** එමනිසා, ගොවි කාන්තාවට කිරි ගවයකු, මී ගවයකු ඇති කිරීමේ හැකියාව තිබෙන බව සඳහන් කළ යුතුය. ප්‍රශ්නය වන්නේ මෙම කාර්යයේ ඔවුන් නොයෙදීම නිසා ගෘහස්ථ කාන්තාව පවුළ සඳහා ඉවුම් - පිහුම් කටයුතු පමණක් කරන තත්ත්වයට පත්ව සිටිමයි. **කාන්තාව විසින් ද, පවුලට ආදායමක් එක් කිරීම සහ පවුලේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා වූ ක්‍රියාකාරකමක් වශයෙන් ගව පාලනයට යොමු වීම අතිශය කාලෝචිත ක්‍රියාවකි.** ආහාර සඳහා තම ගෙවත්තේ තැන තැන දිගෙලි කරමින් ගවයකු දෙදෙනෙකු පෝෂණය කිරීම එතරම් අමාරු කටයුත්තක් නොවේ. අවශ්‍යතාවය වන්නේ පළමුව මේ සඳහා සිත යොමුකොට ක්‍රියාවේ යෙදීමයි.

වර්තමානයේ දී, ග්‍රාමීය අංශයේ ජනතාවට ගව පාලනය සඳහා පවතින ප්‍රධාන ගැටළුවක්ව පවතින්නේ උසස් ආරේ ගව පැටවුන් ලබා ගැනීමට අපහසු වීමයි. මේ සඳහා ග්‍රාමීය මට්ටමේ දී අනුගමනය කළහැකි උචිත විසඳුම් මාර්ගයක් **ගොවි කටයුතු පර්යේෂණායතනය** විසින් **1996 - 1998 කාලය තුල තිරප්පනේ** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දී ක්‍රියාත්මක කරන ලද ෆාම් වැඩසටහන තුල සාර්ථකව ක්‍රියාවට නංවා තිබේ. එනම්, ආරම්භයේ දී, උසස් ආරේ වැස්සි පැටවුන් 10 දෙනෙකු, තෝරාගත් ගෙවිලියන් 10 දෙනෙකුට ලබා දී පසුව, ඔවුන්ගෙන් ඉපදෙන පළමු පැටවා ගොවි සංවිධානයට ආපසු ලබාගෙන යළිත් වෙනත් ගොවීන් 10 දෙනෙකුට ලබාදීමේ ක්‍රමය යි.

***වර්තමාන සොයා ගැනීම් වලට අනුව, ගවයකු ඇති කිරීම සඳහා හෙක්ටයාර් එකකට අඩු බිම් ප්‍රමාණයක් ප්‍රමාණවත් වේ.***

මේ ක්‍රමය නොකඩවා ක්‍රියාත්මක කිරීමෙන් වසර කිහිපයක දී එක් ගමක ගෘහස්ථ ගණනා-වකටම ගවයන් ලබාදීමට හැකියාව ලැබේ. මෙය **චක්‍රිය ගව ව්‍යාප්ති ප්‍රවර්ධන වැඩසටහනක්** ලෙස ශ්‍රී ලංකාවේ ගම්වල සාර්ථකව ක්‍රියාත්මක කළ හැකිය. මෙම ගව ප්‍රවර්ධන වැඩසටහන සඳහා උතුරු මැද පළාත් **සත්ත්ව සංවර්ධන දෙපාර්තමේන්තුවේ** මනා සහයෝගයක් ලැබුණි. ගව පැටවුන් ලබා දීම, ගව ගාල් ඉදි කිරීම සහ වෙනත් ව්‍යාප්ති සේවා පශු වෛද්‍ය කාර්යාලය විසින් ලබා දුන්නේය. මෙම ක්‍රමය සාර්ථක වීම නිසා **තිරප්පනේ** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සැළසුම් අංශය විසින් සංවිධානය කර ඇති **තිරප්පනේ කාන්තා මහා සංගමය** විසින් ද, මෙවැනිම වැඩසටහනක් ක්‍රියාත්මක කළේය. එම වැඩ සටහන යටතේ **මානක්කුලම** වසමේ කාන්තාවන් 22 ක් සඳහා උසස් ආරේ ගව පැටවුන් මුදලට ලබාදීම සිදු කෙරුණි.

ගව පාලනය ක්‍රමවත්ව පවත්වා ගනිමින් එළකිරි ලබා ගැනීම මඟින් පවුලේ ආදායම උසස් කිරීම සහ එළකිරි දරුවන්ට බීමට දීම මඟින් පෝෂණ තත්ත්වය උසස් කිරීමට හැකියාව ලැබේ.

ගවයා, ගොවිපල බිම් සකස් කිරීම, කොළ මැඩවීම වැනි ගොවිපල සත්ත්ව බලයක් සේ යොදා ගැනීමෙන් බෝග වගාවේ නිෂ්පාදන වියදම සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ගත හැකිය.

ගව මූත්‍ර සහ ගොම එකතු කිරීම සහ නිවසේ එකතු වන අපද්‍රව්‍ය ඊට එක්කර කාබනික පොහොර වලක් සාදා ගැනීමෙන් රසායනික පොහොර භාවිතය අඩුකර, එම අඩුව සඳහා කාබනික පොහොර යොදා ගැනීමට හැකියාව උදා වේ.

**ශක්තිමත් ආර්ථිකයක් සහිත ස්වාධීන රටක් බවට සංවර්ධනය වීම සඳහා පසුබිමේ පවතින මූලික අවශ්‍යතාවය වන්නේ ආහාර වලින් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම යි.**

ක්‍රමවත් ගව ගාලක් ඉදි කිරීම මඟින් කුඩා පරිමාණ ජීව වායු ඒකකයක් ඉදිකර ගැනීමට හැකියාව සැලසේ. ජීව වායුව පරිහරණය මඟින් ගැමි ගෘහස්ථයේ ඉන්ධන බලශක්තිය සපුරා ගැනීමේ හැකියාව ලැබේ.

නිවසේ ගෘහණියගේ සහ වැඩුනු දරුවන්ගේ විවේක කාලය ගව පාලනයේ අවශ්‍යතා ඉටු කිරීමට යෙදීම මඟින් තම විවේකය, විනෝදයෙන් සහ අර්ථා-න්විතව ගත කිරීමටත්, සතුන් පිළිබඳ ඇල්මෙන් සහ ආදරයෙන් ක්‍රියා කිරීමේ ප්‍රායෝගික ක්‍රියා-කාරකම මඟින් සමාජයට සහ සතුන්ට ආදරය කරන ගොවි ගෘහස්ථයන් බිහි කිරීමටත්, එහි යහපත් ප්‍රතිඵලයන් සමස්ථ සමාජයේ සුභ සිද්ධියටත් හේතු වේ.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ප්‍රධාන උප අංශය වූ සත්ත්ව පාලන අංශයෙන් ස්වයං පෝෂණය වීම සඳහා දිගුකාලීන දැක්මක් සහිත ක්‍රියාකාරී වැඩ සටහනක අවශ්‍යතාවය පෙන්වා දීමට පුළුවන. මෙම දැක්මේ දී, වර්තමානයේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ ප්‍රයෝජනයට නොගනිමින් පවතින ස්වාභාවික සම්පත් සහ ගම්බද ගෘහස්ථයන්ගේ කාන්තා ශ්‍රමය පිළිබඳව අවධානය යොමු කරමින් කුඩා පරිමාණ ගෘහස්ථ මට්ටමේ ගව පාලන ඒකක පිළිබඳ ව සැළකිලිමත් වීම අවශ්‍යය. උසස් ආරේ ගව පැටවුන් ගොවි ජනතාවට ලබාදීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් ගවයින් බෝ කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම ද වැදගත් ය. ඉතා උසස් අන්දමේ සත්ත්ව ව්‍යාප්ති සේවයක් මඟින් සතුන් රෝග වලින් මුදවා ගැනීම සඳහා කාර්යක්ෂම සත්ත්ව සායන ක්‍රමයක් ස්ථාපිත කළ යුතු වේ. ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුම එළකිරි දියර වශයෙන් පානය කිරීම ව්‍යාප්ත කිරීම සඳහා සුදුසු සිත් ඇදගන්නා දවටන ක්‍රමයක් මඟින් ජනතාව අතට පත් කිරීම සඳහා වූ ප්‍රචාරණ වැඩපිළිවෙලක් ද අවශ්‍ය වේ. ප්‍රාදේශීය මට්ටමින් කිරි මිළ දී ගැනීම සඳහා කිරි මිළ දී ගැනීමේ මධ්‍යස්ථාන සහ සැකසීමේ හා අලෙවි කිරීමේ මධ්‍යස්ථාන ආරම්භ කළ යුතු වේ.

**ශක්තිමත් ආර්ථිකයක් සහිත ස්වාධීන රටක් බවට සංවර්ධනය වීම සඳහා පසුබිමේ පවතින මූලික අවශ්‍යතාවය වන්නේ ආහාර වලින් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම යි.** මෙහි දී, කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ ප්‍රධාන එක් පාර්ශවයක් වන සත්ත්ව පාලනයත්, සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්ෂේත්‍රයක් වන ගව පාලනයත්, දියුණු කිරීමට වැඩි අවධානය යොමු කළ යුතු ය. මේ සඳහා කුඩා පරිමාණ ගෘහස්ථ මට්ටමේ දී, ගැමි කාන්තාව සම්බන්ධ කරගත් වැඩසටහනක් සඳහා අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාවේ පවතී. අවශ්‍ය වන්නේ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ එවැනි වැඩසටහනක් ප්‍රායෝගිකව ආරම්භ කිරීමයි. ඒ සඳහා සත්ත්ව පාලන සහ සත්ත්ව සංවර්ධන ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන මෙන්ම සමස්ථ කෘෂිකර්ම ක්ෂේත්‍රයටම විශාල වගකීමක් ඇත්තේය. **ඉන්දියානු ගෘහස්ථයන් මෙන් අපගේ ගෘහස්ථ වල ද ගවයකු ඇති කිරීම සඳහා ජනතාවගේ අවධානය වඩ වඩාත් යොමු කිරීමට**

**ඉන්දියානු ගෘහස්ථයන් මෙන් අපගේ ගෘහස්ථ වල ද ගවයකු ඇති කිරීම සඳහා ජනතාවගේ අවධානය වඩ වඩාත් යොමු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික වැඩපිළිවෙලක් සැකසිය යුතුය.**

**අවශ්‍ය ප්‍රායෝගික වැඩපිළිවෙලක් සැකසිය යුතුය. මෙහි දී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමූලික සමීක්ෂණ (Action Research) වල** අද්දැකීම් ද විශාල වශයෙන් ප්‍රයෝජනවත් වන්නේය.